www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# උතුරු ශ්‍රී ලංකාවේ මානුෂීය ඛේදවාචකය දිගටම වර්ධනය වේ

## Human tragedy continues in northern Sri Lanka

**සරත් කුමාර විසිනි**
**2009 පෙබරවාරි 23**

උතුරේ වන්නි කලාපය තුල ශ්‍රී ලංකා හමුදාව සහ බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර සටන් දිගටම වර්ධනය වෙද්දී යුද කලාපය තුල කොටු වී ඇති සිවිල් ජනයාගේ ඉරනම වඩවඩා නරක අතට හැරෙමින් තිබේ.

ආරක්ෂක හමුදාවන් සති අන්තයේ දී පුදුකුඩියුරුප්පු නගරය වට කර තිබූ බවත් මහ වනයේ යන්තම් වර්ග කිලෝමීටර් 73ක භූමි පෙදෙසකට එල්ටීටීඊය සීමා කොට ඇති බවත් හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් උදය නානායක්කාර ඊයේ කියාපෑවේය. ආන්ඩුව හා හමුදාව ප්‍රදේශයට ස්වාධීන මාධ්‍යවල ප්‍රවිෂ්ටය වලකා ඇති බැවින් මෙම කියාපෑම්වල සත්‍ය අසත්‍ය භාවය සනාථ කරගැනීමේ විධියක් නැත.

යුද්ධයට එරෙහි ජාත්‍යන්තර විරෝධතාවලට පසුව, ආන්ඩුව මානුෂීය අර්බුදය අවතක්සේරු කිරීමේ උත්සාහයක යෙදී තිබේ. යුද කලාපයේ තවමත් ඉතිරිව සිටින්නේ, විවිධ ජාත්‍යන්තර ආධාර ඒජන්සි තක්සේරු කරන පරිදි 250,000ක් නොව, 70,000ක ජන පිරිසක් පමනක් යයි ආන්ඩුව දැන් අවධාරනය කරයි. සිය ගනන් ජීවිත හා ශාරීරික හානි සිදුවීම ගැන ආන්ඩුවේ ප්‍රකාශකයන් දිගටම බැනවදින්නේ, මිලිටරිය කාලතුවක්කු හා ගුවන් ප්‍රහාර ඉවබවක් නැතිව යොදාගැනීම සම්බන්ධයෙන් නොව ඒ වෙනුවට එල්ටීටීඊය "මිනිස් පලිහක්" ලෙස සිවිල් ජනතාව යොදාගැනීම පිලිබඳවය.

හමුදාව ප්‍රදේශයේ සිවිල් වැසියන් සලකන්නේ සතුරන් ලෙස බව, පෙබරවාරි 13 දා ඇසෝසියේටඩ් ප්‍රෙස් විසින් වාර්තා කරන ලද අදහස් දැක්වීමක දී, ආපදා කලමනාකරන සහ මානව හිමිකම් අමාත්‍ය මහින්ද සමරසිංහ වක්‍රව පිලිගත්තේය. "කොහොමද සිවිල් වැසියෙකු හා ත්‍රස්තවාදියෙකු වෙන්කොට හඳුනාගන්නේ?" යනුවෙන් ඔහු ප්‍රවෘත්ති සාකච්ඡාවක දී කෑගැසීය. සමරසිංහට අනුව, මියගිය සියලු සිවිල් වැසියෝ සරලවම නිල ඇඳුම්වලින් තොර එල්ටීටීඊ සටන්කරුවෝය.

තමන්ට අවාසි සහගත වාර්තා පලවීම වලකාලීමේ උත්සාහයක් ලෙස, ආන්ඩුව ජාත්‍යන්තර රතු කුරුස කමිටුව (අයිසීආර්සී) හැර අන් සියලු මානුෂීය ඒජන්සිවලට ප්‍රදේශයෙන් පිටමං වන ලෙස අන කර තිබේ. පසුගිය දින කිහිපය තුල එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මන්ඩලයේ (යූඑන්සීඑච්ආර්) නිලධාරිහු පිටවූහ. දිගහැරෙන මානුෂීය අර්බුදය පිලිබඳ අංශුමාත්‍රයක් හෝ පෙන්නුම් කරන සියලු මාධ්‍ය වාර්තා "එල්ටීටීඊ ත්‍රස්තවාදීන්ට" උදව් කිරීමක් ලෙස ආන්ඩුවේ ප්‍රකාශකයන් විසින් වහාම හෙලා දකිනු ලැබේ.

මාධ්‍ය වාරනය තිබියදී වුවත්, ආන්ඩුවේ වර්ගෝත්තමවාදී යුද්ධය ව්‍යසනයක් නිර්මානය කර ඇති බව පැහැදිලිය. පුතුමතලාන් නම් වෙරලබඩ ගම්මානයේ පිහිටි තාවකාලික රෝහලෙන් සිවු වතාවක් රෝගීන් ඉවත් කිරීමෙහි අයිසීආර්සී සංවිධානය යෙදී තිබේ. මේ වන තෙක්, තුවාලකරුවන් 1,477ක් හා ඔවුන්ගේ ඥාතීන් ත්‍රිකුනාමලයේ රෝහලට මාරු කර ඇති අතර තවත් බොහෝ සංඛ්‍යාවක් ඒ අවස්ථාව එනතෙක් බලා සිටිති. සිකුරාදා රෝගීන් 397ක් ඉවත් කරගන්නා ලදි.

ඉවත් කරගන්නා ලද ජන සංඛ්‍යාව සටන් මගින් නිර්මානය කෙරෙන ව්‍යසනයේ පරිමාව පිලිබඳ දර්ශකයක් සම්පාදනය කරයි. පුතුමතලාන්හි එම තාවකාලික වෛද්‍ය මධ්‍යස්ථානය පිහිටුවන ලද්දේ පුදුකුඩියුරුප්පු රෝහල නැවතනැවතත් කාලතුවක්කු ප්‍රහාරවලට ලක්වීමෙන් පසුවය. අයිසීආර්සී හා යූඑන්සීඑච්ආර් ප්‍රකාශ මෙම ප්‍රහාර සනාථ කර තිබේ. තමන් රෝහලට ප්‍රහාර එල්ල කල බව මිලිටරිය ප්‍රතික්ෂේප කලත්, එහි ප්‍රකාශකයෝ රෝගීන්ගේ හා කාර්ය මන්ඩලයේ ආරක්ෂාව සහතික කිරීම ද ප්‍රතික්ෂේප කලහ.

පෙබරවාරි 18 දා නිකුත් කල ප්‍රකාශයක, අයිසීආර්සී ප්‍රකාශක පොල් කැස්ටෙලා පුතුමතලාන්හි පවතින මංමුලාසහගත තත්වය විස්තර කලේය. "අප අද (මගී බෝට්ටු යොදාගෙන) ජීවිත බේරා ගත් නමුත් බොහෝ දෙනෙක්, අසරනව, තමන් ඉවත් කරගැනීම නොඉවසිලිමත්ව බලාපොරොත්තුවෙන්, තවමත් එහි ඉතිරිව සිටිති. එය දැන් ජීවිතයත් මරනයත් අතර ප්‍රශ්නයකි." අයිසීආර්සී ප්‍රකාශිකා සරසි විජේසිංහ *අයිආර්අයිඑන්* ප්‍රවෘත්ති ඒජන්සියට මෙසේ පැවසීය:

"තව තවත් ජනතාව පුතුමතලාන්වලට ගලා එනවා. එහේ තාවකාලිකව අටවන ලද වෛද්‍ය හා රෝගීන් වර්ගීකරන මධ්‍යස්ථානයක් තියෙනවා. රෝගීව හා තුවාල ලබා සිටින අය ඉවත් කර ගන්න නිරන්තර මගී බෝට්ටු යොදා ගැනීමේ අපි දිගටම යෙදී සිටිනවා."

පුතුමතලාන් රෝහලේ වැඩ කරන ප්‍රාදේශීය සෞඛ්‍ය අධ්‍යක්ෂක වෛද්‍ය තුරෙයිරාජා වර්ධරාජා පෙබරවාරි 13 දා *ඇසෝසියේටඩ් ප්‍රෙස්* පුවත් සේවයට කියා සිටියේ, තියුනු ෂෙල් ප්‍රහාරවලින් සෑම දිනකම සිවිල් වැසියන් 40ක් පමන ජීවිතක්ෂයට පත්වන හා 100කට වඩා තුවාල සිදු වන බවයි.

බොහෝ දෙනෙකුට තුවාල වී ඇත්තේ බෝම්බ හා උන්ඩ කැබලි හේතු කොටගෙනය. එහෙත් රෝගීහු පෙනහලු ආසාදනවලින්, උනෙන් හා කැස්සෙන් ද පෙලෙමින් සිටියහ. ඒ බොහෝ විට වාෂ්ප හා දුම ආශ්වාස කිරීම නිසාය. ප්‍රදේශයේ රැඳී සිටින්නේ වෛද්‍යවරු අට දෙනෙක් පමනි. එහෙත් කාර්ය මන්ඩලයේ බොහෝ දෙනෙක් අන්තරායන් හේතු කොටගෙන වැඩට පැමිනීම නතර කොට තිබේ. රෝහලේ පෙනිසිලින් ඇතුලු අත්‍යවශ්‍ය ප්‍රතිජීවක නිමවෙමින් පවතින බව වර්ධරාජා පැවසීය.

ආහාර හෝ ඖෂධ වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ඇතුලු සියලු සැපයුම් ඉතිරිව පවතින එල්ටීටීඊ-පාලිත භූමි ප්‍රදේශවලට ඇතුලුවීම ආන්ඩුව බරපතල ලෙස සීමා කර තිබේ. පිටි ටොන් 20ක්, පරිප්පු ටොන් 6ක් හා සීනි ටොන් 4ක් ඇතුලු මෙට්‍රික් ටොන් 30ක තොගයක් පෙබරවාරි 18 දා යවන ලදි. මෙය ජනවාරි 29දාට පසුව යැවුනු මුල්ම තොගය විය. අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් එස්.බී. දිවාරත්න සැපයුම්වල මඳ භාවය යුක්තියුක්ත කරමින් කියාසිටියේ ඒවා එල්ටීටීඊය අතට නොවැටෙනු ඇති බවට කිසිදු සහතිකයක් නැති බවයි.

යලි ඇරඹූ යුද්ධයේ පසුගිය මාස 30ක කාලය තිස්සේ පැවති අතීත සටන්වලදී මෙන් ම, ආන්ඩුවේ හා හමුදාවේ මූලෝපාය වී ඇත්තේ, අඛන්ඩ ප්‍රහාර මගින් එල්ටීටීඊය දුර්වල කිරීම සහ ජනතාව ත්‍රස්ත කරනු පිනිස සංඛ්‍යාත්මකව ද ගිනිබලයෙන් ද තමන්ට පවතින අතිමහත් සුපිරිබලය යොදා ගැනීමයි. එල්ටීටීඊය කුඩා භූමි ප්‍රදේශයකට සීමා කර ඇති මිලිටරියට අවශ්‍ය වන්නේ, සමස්ත ප්‍රදේශයම නිදහසේ ප්‍රහාර එල්ල කල හැකි කලාපයක් බවට පරිවර්තනය කරගත හැකි වන පරිදි, සිවිල් වැසියන්ට එයින් පිටවීමට බල කිරීමයි.

නැගෙන මරන සංඛ්‍යාව මහජන විරුද්ධත්වය අවුලුවාලනු ඇතැයි භීතියෙන්, පසුගිය ඔක්තෝබරයේ දී මිලිටරිය තම භටයන්ගේ ජීවිත හානි පිලිබඳ විස්තර නිකුත් කිරීම නතර කලේය. බොහෝ සොල්දාදුවෝ, රැකියා හෝ සෙසු අවස්ථාවන් නොමැති දුගී ගම්බද ප්‍රදේශවලින් පැමිනි, ආර්ථික හේතු නිසා හමුදාවට බැඳුනු තරුනයෝ ය. මරන සංඛ්‍යාවන් නිකුත් කර නොමැති අතරම, ආන්ඩුවේ ආරක්ෂක ප්‍රකාශක පිලිගෙන ඇත්තේ, මෑත මාසවල සටන්වලින් සොල්දාදුවන් 3,000ක් ජීවිතක්ෂයට පත්ව ඇති බවයි. ගම්බද ප්‍රදේශවල සොල්දාදුවන් වෙනුවෙන් ප්‍රදර්ශනය කෙරෙන සුදු කොඩි හා මරන දැන්වීම් සුලභ දසුනක් බවට පත්ව ඇත.

මානුෂීය අර්බුදය පිලිබඳව නැගෙන ජාත්‍යන්තර හෙලාදැකීම් මධ්‍යයේ, ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ රටේ සංචාරයක යෙදෙන ලෙස එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කි-මූන්ට ආරාධනා කලේය. බැන් ආරාධනාව ප්‍රතික්ෂේප කල නමුත් මානව කටයුතු පිලිබඳ උප මහ ලේකම් ජෝන් හෝල්ම්ස් තමා වෙනුවෙන් පසුගිය සතියේ ශ්‍රී ලංකාව එවීය.

රාජපක්ෂ හමුවීමෙන් හා උතුරු ශ්‍රී ලංකාවේ වවුනියාවේ සංචාරයක යෙදීමෙන් පසුව, හෝල්ම්ස් ආන්ඩුවට හා එහි යුද්ධයට සුදු හුනු ගෑමක් ලෙස පමනක් විස්තර කල හැකි ප්‍රකාශයක් කලේය. "ඝාතනයට ලක්වන අයගෙන් කී දෙනෙක් සිවිල් වැසියන් ද ඒ වගේ ම මොන යම් හෝ සුවිශේෂ සිද්ධියක් සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුද යන වග කියන්න අමාරුයි." යයි ඔහු ප්‍රකාශ කලේය. සිවිල් වැසියන් ආරක්ෂා කරන ලෙස එල්ටීටීඊය හා ආන්ඩුව යන දෙපාර්ශ්වයෙන්ම ඉල්ලා සිටීමෙන් පසුව, හෝල්ම්ස් එල්ටීටීඊය මත අවධානය යොමු කරමින් ඉල්ලා සිටියේ, එය සිය පාලනය යටතේ පවතින ප්‍රදේශවලින් සිවිල් වැසියන් නිදහස් කල යුතු බවයි.

සටන් පවතින ප්‍රදේශවලින් පලා එන සිවිල් වැසියන් එය විසින් රඳවා තබාගැනීම් සම්බන්ධයෙන් පැනනැගි විවේචන මධ්‍යයේ, හෝල්ම්ස් දෙමල සරනගතයන්ට ඉහලින්ම් සලකන්නේ යයි ආන්ඩුවට ප්‍රශංසා කලේය. යුද සරනගතයන් 200,000ක් තරම් විශාල සංඛ්‍යාවක් වසර තුනක් දක්වා අනිවාර්යයෙන් ම රඳවා ගනු වස් දැවැන්ත "සුබසාධක ගම්මාන" පිහිටුවීමට මේ දැන් යෝජනා කරන ආන්ඩුව ඒ සඳහා ජාත්‍යන්තර මුදල් ආධාර හා සහයෝගය ලබාගැනීමේ උත්සාහයක යෙදී සිටී.

පසුගිය සතියේ දී, එල්ටීටීඊ ප්‍රකාශක බී. නඩේසන්, එක්සත් ජාතීන්ගේ සංවිධානය සිවිල් වැසියන්ට උදව් නොකිරීම සම්බන්ධයෙන්, සිය පුදුමය පල කලේය. දෙමල ජනතාව "ආරක්ෂා කිරීමට එක්සත් ජාතීන්ගේ සංවිධානය සඵල ක්‍රියාමාර්ග නොගැනීම" ගැන එල්ටීටීඊය "ගැඹුරු ලෙස දුකට හා ව්‍යාකුලත්වයට" පත්ව ඇතැයි ඔහු පැවසීය. ඔහුගේ ව්‍යාකුල අවිශ්වාසය වනාහි පසුගිය තුන් වසර තිස්සේ රාජපක්ෂ ආන්ඩුවේ යලි ඇරඹූ යුද්ධයට සිය සහයෝගය දී ඇති" ජාත්‍යන්තර ප්‍රජාව" වෙත කෙරෙන තවත් එක් නිෂ්ඵල ආයාචනයක් පමනි.

ධෛර්‍ය්‍ය ඉහල දමාගැනීමේ මංමුලාසහගත වෑයමක් ලෙස, එල්ටීටීඊය පසුගිය සිකුරාදා අගනුවරට පහර දීමේ මරාගෙන මැරෙන මෙහෙයුමක සැහැල්ලු ගුවන් යානා දෙකක් එව්වීය. එක් යානයක් කොලඹ දේශීය ආදායම් දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල තුලට කඩා වැටුනු අතර අනෙක කටුනායක පිහිටි ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ගුවන් තොටුපල අසල දී වෙඩි තබා බිම හෙලන ලදි. යුද්ධයේ ගමන් මාවත වෙනස් නොකරනු ඇති එවන් ප්‍රහාර එල්ටීටීඊයේ ඉදිරිදර්ශනයේ -- එනම්, වෙනම දෙමල රාජ්‍යයකට සහයෝගය දෙනු පිනිස අධිරාජ්‍යවාදී බලවතුන්ට බලපෑම් දැමීමේ සන්නද්ධ අරගලයක -- අවෘත අන්තය අවධාරනය කරයි.

සටනට කොටු වී සිටින දෙමල සරනගතයන්ගේ ඉරනම සම්බන්ධයෙන් රාජපක්ෂ ආන්ඩුවේ නරුම නොතැකීම, දිවයින පුරා වැඩ කරන ජනතාවට අනතුරු ඇඟවීමකි. එල්ටීටීඊය මිලිටරි වශයෙන් පරාජය කිරීම ප්‍රජාතන්ත්‍රවාදය හා සෞභාග්‍යය ගෙන එන්නේ නැති අතර එය රටේ ගැඹුරු වන ආර්ථික අර්බුදය මධ්‍යයේ රාජපක්ෂගේ දක්ෂිනාංශික පාලක කල්ලියේ තත්වය ශක්තිමත් කරනු ඇත. සටනේ අවසානයක් පන්ති අරගලයේ තව දුර උත්සන්න වීමක් සිදු කරනු ඇති අතර එහි දී දෙමල සුලුතරයට එරෙහිව යොදාගැනෙන පොලිස්-රාජ්‍ය විධික්‍රම සමස්තයක් ලෙස කම්කරු පන්තියටම එරෙහිව පුලුල් කෙරෙනු ඇත.

© www.wsws.org